# කළුතර කලාප අධ්‍යාපන කාර්යාලය

## පෙරදිග සංගීතය

11 ශ්‍රේණිය          කාර්ය පත්‍රිකා 1

පහත දැක්වෙන්නේ විෂය නිර්දේශයට අයත් රාග විස්තර සහිත වගුවකි. එය ඇසුරින් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| රාගය | මේලය | ආරෝහණ<br>අවරෝහණ | ජාතිය | විකෘති ස්වර | වාදී | සංවාදී | අනුවාදී | විවාදී | මුඛ්‍යාංගය |
|---|---|---|---|---|---|---|---|---|---|
| බිලාවල් | බිලාවල් | ස රි ග ම ප ධ නි ස<br>ස නි ධ ප ම ග රි ස | සම්පූර්ණ | - | ධ | ග | ස රි ම ප නි | - | ගරිගප ධනිස |
| යමන් | කල්‍යාණ | ස රි ග ම ප ධ නි ස<br>ස නි ධ ප ම ග රි ස | සම්පූර්ණ | 1 | ග | නි | ස රි ම ප ධ | - | නිරිගරි ස<br>ප ම ග රි ස |
| කාෆි | කාෆි | ස රි ගු ම ප ධ නි ස<br>ස නි ධ ප ම ගු රි ස | සම්පූර්ණ | 2 | ප | ස | රි ගු ම ධ නි | ග නි | සස රිරි ගුගු<br>මම ප |
| භෛරවී | භෛරවී | ස රි ගු ම ප ධ නි ස<br>ස නි ධ ප ම ගු රි ස | සම්පූර්ණ | 4 | ම | නි | ස රි ගු ප<br>ධ | රි ග<br>ධ නි | මගු සරිස<br>ධ නිස |
| භූපාලි | කල්‍යාණ | ස රි ග ප ධ ස<br>ස ධ ප ග රි ස | ඖඩව | - | ග | ධ | ස රි ප | | ගරිසධ සරිග<br>පගධපග රිස |

(1) විකෘති ස්වර රහිත රාග මොනවාද?

(2) විකෘති ස්වර එකක් සහිත රාග නම් කරන්න.

(3) විකෘති ස්වර හතරක් සහිත රාගය නම් කරන්න.

(4) යමන් රාගයේ යෙදෙන විකෘති ස්වර මොනවාද?

(5) කාෆි රාගයේ යෙදෙන විකෘති ස්වර මොනවාද ?

(6) එකම මේලයෙන් උපන් රාග දෙක නම් කරන්න.

(7) සම්පූර්ණ ජාති රාග කීයද ? එම රාග නම් කරන්න.

(8) ඖඩව ජාති රාගය නම් කරන්න.

(9) වාදී ස්වර සමාන රාග මොනවාද ?

(10) අනුවාදී ස්වර හඳුන්වන්න .

(11) රාගයක ජාතිය තීරණය කරන සාධකය කුමක්ද ?

(12) රාගයක තිබිය හැකි අවම ස්වර ගණන කීයද ?

(13) ශුද්ධ ග නි විවාදී ස්වර ලෙස යෙදෙන රාගය කුමක්ද ?

(14) විවාදී ස්වර යනු කුමක්ද ?

(15) නිශාද දෙකම යොදා ගත හැකි රාගයක් නම් කරන්න.

(16) ස්වර 12 ම යොදා ගත හැකි රාගය කුමක්ද ?

(17) රාගයක ගාණසමය යනු කුමද්ද ?

(18) මේලයේ නමින්ම උපදින රාග හඳුන්වන නම කුමක්ද ?

(19) විවාදී ස්වර පහක් යොදා ගත හැකි රාගය කුමක්ද ?

(20) බිලාවල් සහ භූපාලි රාග අතර ඇති සමාන අසමානකම් මොනවාද?

(21) නිරිගරිස, පමගරිස ස්වර සංගතිය කුමන රාගයකට අයත්ද?

(22) භූපාලි රාගයට අදාළ සරිගප, රිගපධ යන ස්වර අභ්‍යාසය උච්ච ගාන්ධාරය දක්වා ලියා දක්වන්න.

(23) "ග ස්වර වාදී නි සංවාදී" මෙම ගී පාදය කුමන රාගයකට අයත් ගීතයකින් උපුටා ගැනුනක්ද?

(24) වාදී ස්වර, සංවාදී ස්වර, වර්ජිත ස්වර වෙන වෙනම හඳුන්වන්න.

(25) පහත දැක්වෙන රාගාශ්‍රිත සරල ගී තනු නිර්මාණය කර ඇති රාග පිළිවෙලින් නම් කරන්න.

(1) ස්වර්ණ ප්‍රදීපාය මාන සූරිය විමනයි.

(2) ගුමු ගුමුව වදුලේ

(3) බඹරෙකු ආවයි නිරිත දිගේයා

(4) ලලිත කලා ඔප කරනා

(5) එන්න මද නලේ ගොස් පවසන්න දුක මගේ

(26) "/ස රි ග ම / ග - රි - / ස - ධ නි / ස - - - /"මෙම ස්වර පාදය භෛරවී රාගයට ගැලපෙන පරිදි සවර සංකේත යොදා සකස් කරන්න

(27) "/නි ධ - ප/ම ප ග ම/ ප - - - /ප ම ග රි/" මෙම ස්වර පාදයට අදාළව අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1) මෙය කුමන රාගයකට අයත්ද ?

2) එම රාගයට ගැලපෙන සේ සංකේත යෙදා ලියන්න.

3) මෙම ගී පාදය අයත්වන ගී විශේෂය කුමක්ද ?

3) ඉහත ගී පාදය සඳහා වැයෙන තාලය නම් කරන්න.

4) එම තාලය ප්‍රස්තාර කරන්න.

(28) "බැබළේ- -පුරහඳ පෝදිනේ - - - " මෙම පද ප්‍රස්තාරයට අදාළව අසා ඇති පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1) මධ්‍යලයෙන් යුත් මෙම ගී පාදය නියමිත තාලයට අනුව ප්‍රස්තාර කරන්න.

2) මෙම ගී පාදයට නියමිත ස්වර පාදය තාලයට අනුව ප්‍රස්තාර කරන්න.

3) එම රාගය නම් කරන්න.

4) එම රාගයේ ඇති විශේෂ ලක්‍ෂණ 2 ක් ලියන්න.

(29) පහත දැක්වෙන ස්වර සංගති අයත් රාග නම් කරන්න.

1) මගමරි ගප මගමරිස

2) රිගුරිම ගුරිස, රිපමප මගුමරි

4) ගපධප ගරිස

5) නිසගුමපම ගු රිස

❖ පහත දැක්වෙන ලක්‍ෂණ ගීතය ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

"ස්වර දෙක ග හා නි කෝමල වන - තෙවන සමයෙ රෑ පූරණ ජාතිය"

(30)1 ඉහතින් ප්‍රකාශ වන රාගය නම්කරන්න.

2 එම රාගයේ ඇති විශේෂ ලක්‍ෂණ 2 ක් ලියන්න.

3 එම රාගයේ මධ්‍යලය ගීතයේ ගීත ස්වර ප්‍රස්තාරය ලියන්න.

❖ පහත සඳහන් විෂය නිර්දේශයට අයත් හින්දුස්තානි තාල පද ආශ්‍රිතව අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(31) සෑම විභාගයකම අවසන් මාත්‍රාවේ අක්‍ෂරයක් යෙදී නොමැති තාල පදය නම් කරන්න..

(32) ඉහතින් දැක්වෙන තාල පදය නියමිත ආකාරයට ප්‍රස්තාර කරන්න.

(32) " ධි, න, ති " යන අක්‍ෂරයන් ගෙන් පමනක් නිර්මාණය වී ඇති තාල පදය නම් කරන්න.

(33) ඉහත තාල පදයට සමාන දේශීය තිත් රූපය නම් කරන්න.

(34) එම තිත් රූපය නියමිත ආකාරයට ප්‍රස්තාර කරන්න.

(35) එම තාල පදයේ සහ තිත් රූපයේ සමාන අසමානකම් දෙක බැගින් ලියා දක්වන්න.

(36) "ආවර්තය" යනු කුමක් ද?

(37) "සමග්‍රහය" පිළිබඳ කරුණු 2 ක් ලියන්න.

(38) මාත්‍රා 4 න් 4 ර විභාග වන තාල පද නම් කරන්න.

(39) තාලයක ඇති දුර්වල ස්ථානය හැඟ වීම සඳහා යොදන සංකේතය පිළිබඳ එක් කරුණක් ලියන්න.

(40) හින්දුස්ථානි තාල වාදන භාණ්ඩ නම් කරන්න.